

# අතීතයෙන් නොමැකෙන සොඳුරු මතකයන්

ඩී. එම්. දිනුලි උමේදී දිසානායක

**අතීතයෙන් නොමැකෙන සොඳුරු මතකයන්**

**කර්තෘ**
ඩී.එම්. දිනුලි උමේදී දිසානායක

---

ISBN 978-624-211-335-7

---

**කතෘගේ වෙනත් කෘති**
ගිරා යාළුවා
බය නැති තෙල්කුඹී පැංචා

---

**ප්‍රථම මුද්‍රණය**
2026 ජූලි

---

**මුද්‍රණය**
පන්හිඳ ප්‍රින්ටර්ස්, මහනුවර
071 8 822 822



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

**සරත් බී.එස්. අභයකෝන්,**
**ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.**
**සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.**
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

**ප්‍රදීප් නිලංග දෑල,**
**දියවඩන නිලමේ,**
**ශ්‍රී දළදා මාලිගාව**
**2026.05.10**

ගෙවී ගිය වසර කිහිපය අතරින් 2025 වන මෙම වසර මාගේ ජීවිතයට අමුතුම සතුටක්, විනෝදයක් හා චළියක් ගෙන දුන්නේ ඉතා වෙනස් ආකාරයෙනි. මීට පෙර අවුරුදුවල මා අත්විදි නැති අමුතුම විනෝදයක් ලැබුණෝ මාගේ සිත තවතවත් විනෝදයට බර කරමිනි. එයට හේතු වූ කරුණු බොහොමයක් ඇති අතර මාගේ බලා පොරොත්තුව මේ වසර තුළ මාගේ ජීවිතයට ලැබුණු සතුට පිළිබඳ මතකාවර්ජනය කිරීමටයි.

එදා ජනවාරි 19 වන සඳුදාය. එදින මටද මාගේ පවුලේ සියලු දෙනාට විශේෂ දවසකි. එදින මාගේ තාත්තාගේ අයියා වන ලොකු තාත්තාගේ 50 වෙනි උපන්දිනය මෙදින යෙදී තිබු නිසාය. මීට පෙර මාගේ තාත්තාගේ මල්ලී වන බාප්පා සහ ඔහුගේ පවුලේ සියලු දෙනා එක්ව ත්‍රිකුණාමලය ගිය ගමනත් සමගය ලොකුක තාත්තා ගේ හා පවුලේ සියලු දෙනාගේ සිත් ඇදී ගියේය. ඉන් පසු ලොකු තාත්තාගේ උපන්දිනය දින ත්‍රිකුණාමලය යාමට තීරණය කළහ.

පසු දවසක අප සියලු දෙනාම අත්තම්මලාගේ ගෙදරට එක් රැස් වූයේ ගමන යාමට දිනය වේලාව හා යන ස්ථාන කථා කර ගැනීමටයි.




කෙමෙන් කෙමෙන් දින ගණිමින් සිටි දවස උදාවිය. එනම් 2025.04.12 වෙනි දිනයයි. එදින උදෑසන 9.00 පමණ ගමන පිටත් විය. උදෑසන ආහාර ගැනීම සඳහා කන්තලේ වැව අසල නැවැත්වීමට තීරණය කළහ.




උදෑසන ආහාරය ගෙන නැවත් ගමන ආරම්භකල අපි පැය කිහිපයකින් පසු නාවික කඳවුරට ළඟාවුවෙමු. ඉන් පසු අපි දහවල් ආහාරය ගෙන සවස් කාලයේ මුහුද කරා පියමන් කෙරුවෙමු. ඉන් පසු නැවත පැමිණ ආහාර ගෙන නින්දට ගියෙමු.




ඉන් පසු දින උදෑසන 4.00 විතර අවිදි වූ අපි මුහුණ සෝදා අලංකාර ඇඳුම් ඇඳ පිටතට ආවෙමු.




ඉන් පසුව අපි සියලු දෙනා උදෑසන ආහාරය ගෙන නාවික තටාංකය සඳහා පිටත් වුවෙමු. එහිදි අපි සෝබාර් දුපත වෙත ගියෙමු.




ඉන් පසු අපි සියලු දෙනා කැලෑවක් මැදින් ගමන් කර උස කුළුනකට නැග අවට සිරිය නැරඹුවෙමු.




ඉන් පසුව අපි සියලුදෙනා කායක්කා බෝට්ටු පැදීම සඳහා ගියෙමු. එහිදි අපි දැඩි ප්‍රීතියක් අත්කල ගත්තෙමු.




එයින් පසු අපි පියමන් කෙරුවේ නාන තටාකය වෙතය. එහිදී ද කෙළි සෙල්ලමින් දැඩි සතුටක් අත්වින්දෙමු. ඉන් පසු දහවල් ආහාරය ගෙන එම දූපතෙන් පිටත් වුවෙමු.



ඉන් පසුව නාවික තටාංකය වෙත පැමිණි පසු වාහන වල නැග අපි සියලු දෙනා නිලාවේලි වෙරල කාරා ගියෙමු. පසුව සවස තේ බීම සඳහා විජයබා නාවික කඳවුරවෙත පැමිණියෙමු. තේ බීමෙන් පසුව නැවතත් පැරකුම්බා නාවික කඳුවුර වෙ පැමිණියෙමු. පසුව රාත්‍රි ආහාර ගෙන සියලු දෙනා නින්දට ගියෙමු.



තවත් දවසක් උදාවිය. එනම් සිංහල දෙමළ අලුත් අවුරුද්දයි. එදින උදෑසන ආහාර ගෙන අපි සියලු දෙනා අවුරුදු උත්සවය සඳහා ගියෙමු. එහිදී විවිධ ක්‍රීඩා රැසක් තිබුණ අතර අපි එහින් තෑගි දිනා සතුටු වුවෙමු. පසුව දහවල් ආහාරය ගැනීම සඳහා අපි නැවත ගියෙමු.



දහවල් ආහාරය ගැනීමෙන් පසු සවස් කාලයේ සාම්පූර් ප්‍රදීපාගාරය නැරඹීම සඳහා අපි සැවොම ගියෙමු. එය නැරඹා පැමිණි පසු තේ බී මුහුදු වෙරළට ගොස් සතුටු වුවෙමු. ඉන් පසු ගීත ගයා සතුටු වී රාත්‍රී ආහාර ගෙන නින්දට ගියෙමු.



15 වෙනි දින අවසන් වතාවට අපි මුහුදට ගොස් විනෝද වී පැමිණීමෙන් පසු සවස් කාලයේ ලංකා පටුන විහාරයට හා සේරුවාවිල විහාරයට ගියෙමු.



ඉන් පසු නැවත පැමිණි පසු ආහාර ගෙන නින්දට ගියෙමු. ඉන් පසු දින අපි සියලු දෙනාම නුවර බලා පිටත් වුවෙමු. මෙම ගමන මාගේ ජීවිතයේ සතුට ලබා දුන් නොමැකෙන සිහිවටනයක් විය.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සම්බන්ධ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)



**නම**
ඩී.එම්.දිනුලි උමේදී දිසානායක

**පන්තිය**
8 - D

**පාසල**
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

**පන්තිභාර ගුරුතුමා/ තුමියගේ අත්සන**

..........................................

**අංශභාර ගුරුතුමා/ තුමියගේ අත්සන**

..........................................